# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,276 - 2022 අප්‍රේල් මස 12 වැනි සිකුරාදා - 2022.04.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන | — |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 596 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 මැයි මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 අප්‍රේල් මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

595 B 82333— 425 (2022/04)
A 1-

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## සම්පත් බැංකුව පීඑල්සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

කේ. වී. මහින්දසිරි
ගිණුම් අංක : 0041 5000 2791

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2019.10.31 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. කලංසූරිය යන අය විසින් ලියා සහතික කරන ලද 2006 අගෝස්තු 08 දාතම හා අංක 337 දරන, රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් කේ. එල්. එම්. ඩී. කිත්සිරි අය විසින් ලියා සහතික කරන ලද 2007 දෙසැම්බර් 06 දාතම හා අංක 202 දරන, 2010 නොවැම්බර් 19 දාතම හා අංක 886 දරන, 2012 ජූලි 04 දාතම හා අංක 1335 දරන 2013 අගෝස්තු 06 දාතම හා අංක 1543 දරන, 2014 ඔක්තෝබර් 29 දාතම හා අංක 1959 දරන උකස් බැඳුම්කර සියල්ල සහ ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. එන්. ද සිල්වා යන අය විසින් ලියා සහතික කරන ලද 2018 දෙසැම්බර් 28 සහ 2019 ජනවාරි 02 දාතම හා අංක 5060 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනවල මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ විතානගේ මහින්දසිරි යන අය බන්ධනදායී වශයෙන් පැහැර ඇති හෙයින් ද, එකී අංක 337, 202, 886, 1335, 1543, 1959 සහ 5060 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් එක්කෝටි හත් ලක්ෂ විසි අට දහස් හතලිස් අටයි ශත අසූවක (රු. 10,728,048.80) මුදලක් 2019 ඔක්තෝබර් 07 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් එක්කෝටි හත් ලක්ෂ විසි අට දහස් හතලිස් අටයි ශත අසූවක (රු. 10,728,048.80) මුදලද, 2019 ඔක්තෝබර් 08 දින සිට අංක 337, 202, 886, 1335, 1543, 1959 සහ 5060 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි විසි එක් දහස් පන්සිය පහයි ශත හැත්තෑව (රු. 10,021,505.70)ක මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 337, 202, 886, 1335, 1543, 1959 සහ 5060 දරන එකී උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛන වල මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන්වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර, එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

1. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුකුළු කෝරළේ, මැද පත්තුවේ, කලවාන ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ හඟරන්ගල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කලවාන ග්‍රාමයේ පිහිටි "ගිලිලෑන්ඩ් එස්ටේට් හි කොටසක් *නොහොත්* කලවාන නින්දගම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන බී. කේ. එස්. බමුණුසිංහ යන අය විසින් සාදන ලද 2005 දෙසැම්බර් 02 දාතම හා අංක 2005/226 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අඩි පාර (අඩි 10 පළල) සහ බලයලත් මානක තැන එන් ද එස් වීරක්කොඩි යන අය විසින් සාදන ලද අංක 1183 දරන පිඹුරේ ලොට් 2, නැගෙනහිරට : බලයලත් මානක තැන එන්. ද එස්. වීරක්කොඩි යන අය විසින් සාදන ලද අංක 1183 දරන පිඹුරේ ලොට් 2 සහ අංක 1002 දරන පිඹුරේ ලොට් 2, දකුණට : අංක 1002 දරන පිඹුරේ ලොට් 2 සහ උපාලි නාවලගේ සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන මෙම ඉඩමේ ඉතිරි කොටස සහ බස්නාහිරට : උපාලි නාවලගේ සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන මෙම ඉඩමේ ඉතිරි කොටස සහ අඩි පාර (අඩි 10) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකක් (අක්. 2) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2005/226 දරන පිඹුරට අනුවය.

පහත සඳහන් දෑ දිගේ හා ඒ මතින් ඒ යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

අංක 1183 දරන පිඹුරේ නිරූපිත ලොට් 4 (අඩි 10 පළල පාර සඳහා වෙන්කිරීම)

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී කලවාන ග්‍රාමයේ පිහිටි "ගිලිලෑන්ඩ් එස්ටේට් හි කොටසක් කලවාන නින්දගම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එන් ද එස් වීරක්කොඩි යන අය විසින් සාදන ලද 1982 පෙබරවාරි 10 දාතම හා අංක 1183 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 4 සහ පාර සඳහා වෙන්කිරීම (අඩි 10 පළල) නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 2,

දකුණට : ආටිගලවත්ත *නොහොත්* අංක 1002 දරන පිඹුරේ ලොට් 1 සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකක් (අක්. 2) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1183 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව B 14/07 යටතේ රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 337, 202, 886, 1335 සහ 1543 මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.)

2. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුකුළු කෝරළේ, මැද පත්තුවේ, කලවාන ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ හඟරන්ගල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කලවාන ග්‍රාමයේ පිහිටි "ගිලිලෑන්ඩ් එස්ටේට් (කලවාන නින්දගමට අනුබද්ධ)" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඩබ්ලිව්. එස්. කේ. වික්නරාජා යන අය විසින් සාදන ලද 2014 මැයි 26 දාතම හා අංක 2014/458 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඩී. කේ. සුමතිපාල විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ නිවාසවල සිට පාර, නැගෙනහිරට : නිවාසවලට පාර, දකුණට : නිවාසවලට පාර සහ බස්නාහිරට : පාර සඳහා වෙන්කිරීම සහ ඩී. කේ. සුමතිපාල විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි හයක් (පර්චස් 26) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2014/458 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී කලවාන ග්‍රාමයේ පිහිටි "ගිලිලෑන්ඩ් එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. ඩබ්ලිව්. රත්නායක යන අය විසින් සාදන ලද 1976 ඔක්තෝබර් 16 දාතම හා අංක 1132A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් F වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් G, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් G, දකුණට : මෙම ඉඩමේ ලොට් G සහ බස්නාහිරට : කුකුලේගම සිට කලවාන දක්වා පාර සහ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි හයක් (පර්චස් 26) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1132 A දරන පිඹුරට වෙළුම/පත්‍රිරුව P 30/101 යටතේ රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 1959 සහ 5060 මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

සමාගම් ලේකම්.

04 - 192

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.